# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය (සංස්ථාගත කිරීමේ)

**සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උද්දික ප්‍රේමරත්න මහතා විසින්
2021 මාර්තු මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 මාර්තු මස 15 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[36 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය (සංස්ථාගත කිරීමේ)

### සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව*

“සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය” යනුවෙන් සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ භාරයේ, පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී භාරය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී භාරය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2021 අංක  දරන සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය සංස්ථාගත කිරීම*

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු “භාරය” යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු “භාරය” යනුවෙන් සඳහන් කරනු ලබන) සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු “සංස්ථාව” යනුවෙන් හඳුන්වනු ලබන) සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ භාරය විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ භාරයට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ*

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) භාවනා / යෝග පුහුණුව ලබා දීමට දිවයින පුරා ශාඛා ව්‍යාප්තිය;

(ආ) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට යෝග / භාවනා පුහුණුව ලබා දීම;

(ඇ) සුනාමි / ගංවතුර විපත්තීන්වලට ලක් වූවන්ට ආධාර ලබා දීම;

(ඈ) තරුණ තරුණියන්ගේ නායකත්වය හා පෞරුෂ වර්ධනය කිරීම තුළින් ස්වකීය අභිමානය ඔප් නංවන කුසලතා සංවර්ධනයට අදාළ වෘත්තීය පුහුණු අවස්ථා සැලසීම;

(ඉ) තරුණ ශ්‍රමය හා තරුණ ජවය කාර්යක්ෂම හා ඵලදායී ලෙස ජාතික අභිවෘද්ධිය සඳහා යොදවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැකසීම හා ඊට දායක වීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු එකොළොස් දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් සහ පරිත්‍යාග භාරගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව භාරයට ඇත්තේ ය.

සංස්ථාවේ නීති

**6.** (1) සංස්ථාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ භාරයේ රැස්වීම්වල ගණපූරණය ඇතුළු පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, භාරයේ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් කලින් කළ භාරය විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත්කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම්;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම්කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

භාරය විසින් ගෙවනු ලැබිය යුතු සහ භාරයට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී පැවති භාරය විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන භාරය විසින් ගෙවිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල්, ප්‍රදාන සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාවේ අරමුදල*

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාව සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් වියදම් කරන ලද සියලුම මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව*

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් භාරය වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ භාරය විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතු වන්නේ ය.

*සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම*

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

*සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ*

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

*ගිණුම් සහ විගණනය*

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයෙක් හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**13.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනෙක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතුය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.